# උතුරු පළාත් ආදායම් බදු සේවයට අයත් විධායක ශ්‍රේණියේ පළාත් බදු තක්සේරුකරු III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ තරඟ විභාගය - 2019

උතුරු පළාත් ආදායම් බදු සේවයට අයත් විධායක ශ්‍රේණියේ පළාත් බදු තක්සේරුකරු III වන ශ්‍රේණියේ තනතුරේ පවතින පුරප්පාඩු **පහක් (05)** සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් **2019 අප්‍රේල් මස** යාපනයේ දී පැවැත් වීමට නියමිත බව දන්වා සිටිනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වනුයේ 05.03.2019 වන දිනයි.

## 02. බඳවා ගැනීමේ සේවා කොන්දේසි :-

02.1 **2018.01.01** වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමා අනුමත කරන ලද පළාත් බදු තක්සේරුකරු තනතුරට අදාළ සේවා ව්‍යවස්ථා සංග්‍රහය / බඳවා ගැනීමේ සැලැස්මේ නිර්දේශිත කොන්දේසි, ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් ප්‍රඥප්තීන් හා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක 1817/30 දරණ 2013.07.03 වැනි දින දරණ අති විශේෂ ගැසට් නිවේදනයේ පළ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවය සඳහා වන ආයතන කාර්ය පටිපාටිය යනාදීන්ට හා බඳවා ගැනීමේ කාලවකවානුව තුළ සිදු කරනු ලබන කිසියම් සංශෝධනයන්ට ද යටත් කර තෝරා ගන්නා විභාග අපේක්ෂකයන් **පළාත් ආදායම් බදු සේවයට අයත් පළාත් බදු තක්සේරුකරු** III වන ශ්‍රේණියේ තනතුරට පත්කරනු ලැබේ.

02.2 තරඟ විභාගය මගින් තේරිපත් වන විභාග අපේක්ෂකයන් පත්වීම් දින සිට වසර තුනකට (03) පරිවාස කාලයට යටත් කර අදාළ තනතුරේ III වන ශ්‍රේණියට පත් කරනු ලැබේ. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරකි. සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් පරිදි ඉහත සඳහන් මෙම තනතුරේ III වන ශ්‍රේණියට පත් කරනු ලබන දින සිට වසර තුනක් (03) අවසන් වීමට ප්‍රථම පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත් විය යුතුයි.

02.3 මෙම සේවය ස්ථාන මාරුවීම් වලට යටත් වූ සේවයකි. එබැවින් මෙම පත්වීම ලබා ගන්නා අපේක්ෂකයන් උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුයි යන නියෝගයට යටත් විය යුතුයි.

02.4 එක් සේවා ස්ථානයකින් පත්වීම් ලබන අපේක්ෂකයෙක්, එම සේවා ස්ථානයේම අවම වශයෙන් අවුරුදු පහක් (05) අඛණ්ඩව සේවය කළ යුතුයි යන නියෝගය අනිවාර්ය නියෝගයකි.

02.5 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට අදාළව දිගටම නිකුත් කරනු ලබන චක්‍රලේඛවලට එකගව පත්වීම් දින සිට වසර පහක් (05) අවසන්වීමට ප්‍රථම නියම කර ඇති දෙවන භාෂා ප්‍රවීනතාවය ලබා ගත යුතුයි.

02.6 පත්වීම් ගණන හා පත්වීම ක්‍රියාත්මක වන දිනය යනාදි කරුණු පත්වීම් බලධාරියා විසින් සීමා කරනු ලැබේ. පත්කිරීමට නියමිත අපේක්ෂකයන්ගේ ගණන **පහකි (05)**. කෙසේ වුවද දන්වා ඇති පුරප්පාඩු සම්බන්ධයෙන් කිසියම් පුරප්පාඩු ගණනාවක් හෝ සියළුම පුරප්පාඩු පූර්ණය නොකර සිටීමට පත්වීම් බලධාරියාට බලය ඇත.

## 03 වැටුප් පරිමාණය :-

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 ප්‍රකාර, වැටුප් කාණ්ඩය **SL 1 - 2016** ට අනුව පළාත් ආදායම් බදු සේවයට අයත් පළාත් තක්සේරුකරු තනතුරේ III වන ශ්‍රේණිය සඳහා ඒකාබද්ධ වැටුප් ප්‍රතිශතය වනුයේ **රුපියල් 47,615 – 10 x 1335 – 8 x 1630 - 17 x 2170 – 110,895/-කි.** (රුපියල් 51,620/- ක් වන වැටුප් පියවරට ප්‍රථම පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුයි) කෙසේ වුව ද ඉහත සඳහන් චක්‍රලේඛයේ **II වන වගුවේ** සඳහන් විධිවිධානවලට අනුව වැටුප් ගෙවනු ලැබේ.

## 04 සාමාන්‍ය සුදුසුකම් :-

04.1 අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙක් විය යුතුයි.

04.2 අයදුම්කරු උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු මනා ශාරීරික යෝග්‍යතාවයකින් යුත් පුද්ගලයෙක් විය යුතු අතර මනා චරිතයකින් යුත් පුද්ගලයෙක් ද විය යුතුයි.

04.3 අ) අයදුම්කරු උතුරු පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුයි. මෙම අයදුම්පත් භාරගන්නා අවසාන දිනට ප්‍රථම අයදුම්කරුගේ පදිංචිය අවුරුදු හයකින් (06) අවම වශයෙන් අවුරුදු (03) ක් උතුරු පළාතේ අඛණ්ඩ පදිංචිකරුවෙකු විය යුතුයි.

**හෝ**

ආ) අයදුම්කරු හෝ අයදුම්කරුගේ දෙමාපියන් උතුරු පළාතේ උපන් අය විය යුතු අතර අවම වශයෙන් අවුරුදු පහක් (05) උතුරු පළාතේ අඛණ්ඩ පදිංචිකරුවන් විය යුතුයි **(*සම්මුඛ පරීක්ෂණයේදී ඡන්ද නාම ලේඛනයෙන් උපුටා ගන්නා ලද පිටපතක් සහතික කර ඉදිරිපත් කළ යුතුයි)**

04.4 අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ ඊට ප්‍රථම මෙම තනතුර සඳහා ඉල්ලා ඇති සියළුම සුදුසුකම් අයදුම්කරු විසින් සපුරා තිබිය යුතුයි.

04.5 අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අයදුම්කරුගේ වයස **අවුරුදු විසිදෙකට (22) නො අඩු හා අවුරුදු විසිඅටට (28) නොවැඩි විය යුතුයි**. මුල සිටම පළාත් රාජ්‍ය සේවයේ නියුතු අපේක්ෂකයන්ගේ උපරිම වයස් සීමාව **අවුරුදු තිස්පහක්** (35) විය යුතු අතර ඊට වැඩි නොවිය යුතුයි.

## 05. අධ්‍යාපන සුදුසුකම් :-

අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විශ්වවිද්‍යාලයකින් පළමු පන්තියෙන් **(1st Class)** හෝ දෙවන පන්තියෙන් **(2nd Class)** සමත් වූ උපාධිධාරියෙකු විය යුතුයි.

**හෝ**

ආ) නීතිඥයෙක් විය යුතුයි. **(Attorneys – at – law)**

**හෝ**

ඇ) වරලත් ගණකාධිකාරියෙකු විය යුතුයි. **(Chartedred Accountants)**

## 06. බඳවා ගැනීමේ ක්‍රමය:-

06.1 ලිඛිත විභාගය මගින් කුසලතා පදනම මත, බඳවා ගන්නා අවස්ථාවේදී බලගන්වන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, බඳවා ගැනීමේ සැලැස්ම, ජාතික හා පළාත් ප්‍රතිපත්තීන් යන කරුණුවලට එකඟව පළාත් ආදායම් බදු සේවයට අයත් පළාත් බදු තක්සේරුකරු තනතුරට බඳවා ගනු ලැබේ. මෙම දැන්වීම මගින් ඉල්ලා ඇති සුදුසුකම් සියල්ල සම්මුඛ පරීක්ෂණයේ දී පරීක්ෂා කරනු ලැබේ. අවශ්‍ය සුදුසුකම් නැති බව දැනුවත් වුවහොත් මෙම තනතුර සඳහා තම අයිතිවාසිකම් අහෝසි කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සුදුසුකම්, හා ලියකියවිලි පරීක්ෂාවට ලක් කරනු ලැබේ. මෙම කටයුත්ත සඳහා ලකුණු ප්‍රදානය කරන්නේ නැත.

06.2 ඉහත සඳහන් සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන්ගෙන්, ලිඛිත විභාගයෙන් සුදුසුකම් ලබන විභාග අපේක්ෂකයන් ලබා ගත් සම්පූර්ණ ලකුණු ප්‍රමාණයේ අනුපිළිවෙළ අනුව පවතින පුරප්පාඩුවලට පත්කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණයට තෝරා ගනු ලැබේ.

06.3 පුරප්පාඩුවලින් 03% විශේෂ අවශ්‍යතා ඇති (ආබාධිත) අය සඳහා වෙන් කරනු ලැබේ. විභාග අපේක්ෂකයා පත්වීම් සඳහා තෝරා ගන්නා විට අදාල තනතුරේ සේවය කිරීම සඳහා තම විශේෂ අවශ්‍යතාවයේ තත්වය (Disability) බාධාවක් නොවන බවට විශේෂ වෛද්‍ය පරීක්ෂණ වාර්තාවක් මගින් ඔප්පු කළ යුතුයි. එසේ වුවත් විශේෂ අවශ්‍යතාවයක් ඇති විභාග අපේක්ෂකයෙක් පත්වීම සඳහා සුදුසුකම් ලබන්නේ ලිඛිත විභාගයෙන් සමත් වීමට අවශ්‍ය ලකුණු ප්‍රමාණයක් ලබා ගැනීමේ පදනම මතයි.

## 07. විභාග ගාස්තුව :-

අයදුම්කරු පදිංචි උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක රුපියල් **500.00** ක් "**ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත**" ගේ අංක "**3401**" දරණ තැන්පත් ගිණුමට බැර කරන ලද කුවිතාන්සිය අයදුම්පතේ අදාළ කොටුව තුළ නොගැළවෙන සේ අලවා යොමු කළ යුතුයි. මොනයම් හේතුවක් නිසා හෝ මෙම ගාස්තු නැවත ගෙවනු නොලැබෙන අතර මෙම ගාස්තුව වෙන විභාගයක් සඳහා මාරු කිරීමට ද අවස්ථාව දෙනු ලබන්නේ නැත.

## 08. අයදුම් කරන ක්‍රමය :-

08.1 මෙම දැන්වීම අවසානයේ ඇති ආදර්ශ අයදුම්පතට සරිලනසේ A4 ප්‍රමාණයේ (සෙ.මී21 x සෙ.මී 29) කඩදාසියේ 1 සිට 12 දක්වා ඡේද පළමු පිටුවේ ද 13 සිට 16 දක්වා ඡේද දෙවන පිටුවේ ද ඇතුළත් වන සේ අයදුම්පත සකස් කළ යුතුයි. සම්පූර්ණ කරන ලද අයදුම්පත **05.03.2019** වැනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ, "**ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය, උතුරු පළාත, අංක** :393/48, **කෝවිල් පාර, නල්ලූර්, යාපනය**" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය

08.2 අයදුම්පත යොමු කරන ලිපි කවරයේ වම් උඩ කෙළවරේ “ **පළාත් ආදායම් බදු සේවයට අයත් පළාත් බදු තක්සේරුකරු III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය – 2019”** යනුවෙන් සඳහන් කළ යුතුයි. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අවශ්‍ය තොරතුරු සම්පූර්ණ කර නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08.3 අයදුම්පතේ ඡායා පිටපත තමා වෙත තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. අයදුම්පතේ ඡායා පිටපත හා පූර්ව නිශ්චිත පිටපත් යනාදි භාරගනු නොලැබේ. විභාගයට අදාල ප්‍රවේශ පත්‍රය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරයා විසින් නිකුත් කරනු ලැබේ. විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රය නිකුත් කිරීම යනු **අපේක්ෂකයා විසින් සියළුම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් සේ සැළකිය නොයුතුයි.**

08.4 අයදුම්පත් ඉදිරිපත් කරන සුදුසුකම් ඇති අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ හා සම්බන්ධ පුවත්පත් නිවේදනයක් ද නිකුත් කරනු ලැබේ. විභාග අපේක්ෂකයෙකුට දැන්වීම නිකුත් කර විභාග දිනයට අවම වශයෙන් දින තුනකට (03) පෙර හෝ විභාග ප්‍රවේශ පත්‍ර ලැබුණේ නැතිනම්, ප්‍රවේශ පත්‍ර නොලැබීම සම්බන්ධයෙන් පහත සඳහන් තොරතුරු සමඟ **“ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය, උතුරු පළාත, අංක** :393/48, **කෝවිල් වීදිය, නල්ලූර්, යාපනය”** යන ලිපිනයට දැන්විය යුතුයි. (දුරකථන අංකය - 021 221 9939, දුරකථන අංකය - 021 221 9940)

**සටහන :-**

ප්‍රවේශපත්‍රය නොලැබුණු බව සඳහන් ලිපියක්, අයදුම්පත හා විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සියේ සහතික කරන ලද පිටපත, ප්‍රවේශ පත්‍රය යොමු කිරීම සඳහා ෆැක්ස් අංකයක්.

08.5 විභාගයට අයදුම් කරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ලැබුණු බවට කිසිදු දැන්වීමක් නිකුත් කරනු නොලැබේ. එමෙන්ම අයදුම්පත් භාරගන්නා අවසන් දිනට ප්‍රථම ඉල්ලා ඇති සුදුසකම් පූර්ණය කරනු නොලබන අයදුම්කරුවන්ගේ අයදුම්පත් දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර ඒ සඳහා කිසිදු දැන්වීමක් නිකුත් කරනු නොලැබේ.

## 09. අනන්‍යතාවය ඔප්පු කිරීම :-

අපේක්ෂකයන් තමා පෙනී සිටින සෑම විෂයයන් සම්බන්ධයෙන් අධීක්ෂණ නිලධාරියා සෑහීමකට පත්වන ආකාරයකට ඔබගේ අනන්‍යතාවය ඔප්පු කළ යුතුයි. අනන්‍යතාවය ඔප්පු කිරීමට පහත සඳහන් ලේඛනවලින් මිනැම ලේඛනයක් පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි දෙපාර්තමේන්තුවෙන් ප්‍රදානය කරන ලද ජාතික හැඳුනුම්පත් අංකය
(ii) වලංගු විදේශ බලපත්‍රය.

ඉහත සඳහන් ලේඛනයක් ඉදිරිපත් කිරීමට අපොහොසත්වන විභාග අපේක්ෂකයෙකුගේ විභාගයට පෙනී සිටීමේ හිමිකම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත් ලේකම්, විසින් අහෝසි කළ හැකිය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයන් නැඹුරු විය යුතුයි. එම නීතිරීති උල්ලංඝනය කිරීම යනු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවන දඬුවම්වලට යටත් වීමට සිදුවන බව දන්වා සිටිනු ලැබේ.

## 10. අසත්‍ය තොරතුරු සඳහා දඬුවම්

අයදුම්පත් සම්පූර්ණ කරන විට ඉතාමත්ම අවධානයෙන් නිවැරදි තොරතුරු ඇතුළත් කළ යුතුයි. මෙම විභාග රේගුලාසින් ප්‍රකාර යම්කිසි අයදුම්කරුවෙකු විභාගයට ප්‍රථම හෝ විභාගය පැවැත්වෙන අවස්ථාවේදී හෝ විභාගයෙන් පසුව හෝ අපේක්ෂකයාට සුදුසුකම් නැති බව අනාවරණය වුවහොත් අපේක්ෂකයාගේ අපේක්ෂකත්වය එම අවස්ථාවේදීම අවලංගු කරනු ලැබේ. අයදුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන කිසියම් තොරතුරක් අසත්‍ය බව අනාවරණය වන අවස්ථාවකදී පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබේ.

## 11. අත්සන සහතික කිරීම :-

**සෑම අපේක්ෂයෙක්ම තම අත්සන සහතික කිරීම අත්‍යාවශ්‍යයි.** රජයේ ආයතනයක් මගින් අයදුම් කරන අපේක්ෂකයෙක් තම ආයතන ප්‍රධානියා හෝ ඔහු වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු මගින් සහතික කර ගත යුතුයි. අනෙක් අයදුම්කරුවන් තම ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි, සාම විනිසුරු, දිවුරුම් නිලධාරි, නීතිඥ, නොතාරිස්, නාවික හමුදා, යුදහමුදා, ගුවන් හමුදා යනාදියේ අණ ලැබූ නිලධාරියෙකු, රුපියල් 395,520.00 ට නොඅඩු වටිනාකමින් යුත් වාර්ෂික

ඒකාබද්ධ වැටුපක් ලබන ස්ථිර රජයේ හෝ පළාත් පාලන හෝ පළාත් නිලධාරියෙකු, ආගමික නිකායන් භාරව සිටින ආගමික නායකයන් යන අයගෙන් කෙනෙකු ස්ථිර කළ යුතුයි.

**12. විභාග සැලැස්ම** :-

මෙම ලිඛිත විභාගය පහත සඳහන් කර ඇති පරිදි ප්‍රශ්න පත්‍ර තුනකින් (03) සමන්විත වන අතර මෙම විභාගය දෙමළ හා සිංහල යන භාෂා මාධ්‍යයන් දෙකකින්ම පැවැත්වීමට නියමිතය. අයදුම් කරන ලද භාෂාව මාධ්‍ය පසුව වෙනස් කිරීමට අවස්ථාව ලබා දෙන්නේ නැත.

| අංක | ප්‍රශ්න පත්‍රය | විෂය මාලාව | කාලය | සම්පූර්ණ ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01. | අභියෝග්‍යතා පරීක්ෂණය | මෙම ප්‍රශ්න පත්‍රය තර්කානුකූලව මෙනෙහි කිරීම හා තීරණ ගැනීම සම්බන්ධයෙන් විභාග අපේක්ෂකයාගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා විවිධ තේරීම් ඇතුළත් ප්‍රශ්වලින් යුතු ප්‍රශ්න පත්‍රයකි. | පැය 01 | 100 |
| 02. | සාමාන්‍ය දැනුම | මෙම ප්‍රශ්න පත්‍රය ආර්ථික හා සංවර්ධන, ජාතිකහ හා ජාත්‍යාන්තර වශයෙන් වැදගත් තොරතුරු, විද්‍යාව හා කර්මාන්ත ක්ෂේත්‍රයේ සංවර්ධනය සම්බන්ධයෙන් විශේෂ සටහන් සමඟ ශ්‍රී ලංකාවේ දේශපාලනය ප්‍රජා හා සංස්කෘතික පිළිවෙළ යනාදි කරුණු සම්බන්ධයෙන් විභාග අපේක්ෂකයන්ගේ දැනුම විභාග කිරීමේ ප්‍රශ්න ඇතුළත් ය. | පැය $01^1/_2$ | 100 |
| 03 | අවබෝධය | මෙම ප්‍රශ්න පත්‍රය ඉදිරිපත් කරන ලද වචනය හෝ ඡේදය අවබෝධ කර ගැනීමේ හැකියාව, එය හොඳ නරක වෙන් කර දැනගැනීම, කෙටියෙන්, පැහැදිලි ආකාරයට මැන බැලීම සඳහා සකස් කර ඇත. | පැය $01^1/_2$ | 100 |

**සටහන්** :-

මෙම විභාගය එක් තරඟ විභාගයක් වන බැවින් සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් ලැබීමට සෑම ප්‍රශ්න පත්‍රයකටම වෙන්කරන ලද ලකුණු ප්‍රමාණයෙන් අවම වශයෙන් සියයට හතලිහක් (40%) ලබාගත යුතුයි.. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන් මෙම තරඟ විභාගයෙන් ලබාගත් මුළු ලකුණු ප්‍රමාණයේ අනුපිළිවෙළ (Merit Order) සැලකිල්ලට ගනු ලැබේ.

**13.** විභාග අපේක්ෂකයන්ට අදාල විභාග ප්‍රතිඵල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් www.np.gov.lk යන උතුරු පළාත් අන්තර්ජාලය මඟින් නිකුත් කරනු ලැබේ. ඉන් අනතුරුව විභාගයට පෙනී සිටි සෑම අපේක්ෂකයෙකුටම වෙන වෙනම තැපැල් මඟින් නිකුත් කරනු ලැබේ.

**14.** මෙම විභාගය පැවැත්වීම හෝ අවලංගු කිරීම සම්බන්ධයෙන් සියළුම බලතල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් සතුව ඇත. දෙමළ හා සිංහල මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනුකූලතාවය අතර වෙනසක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක දෙමළ මාධ්‍යය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**15.** මෙම විභාගය සම්බන්ධ නිවේදනය www.np.gov.lk යන උතුරු පළාත් වෙබ් අඩවියට පිවිසීමෙන් බලා ගත හැකිය.

***අ. සිවපාලසුන්දරන්,***
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත්.
01.02.2019